විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
UNIVERSITY GRANTS COMMISSION

මගේ අංකය / எனது இலக்கம் / My Number } UGC/HR/10/01

තැපැල් පෙට්ටිය / அஞ்சல் பெட்டி / Post Office Box } 1406

ඔබේ අංකය / உமது இலக்கம் / Your Number }

20, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව.
௨௦, வாட்டு இடம், கொழும்பு 7, இலங்கை.
20, Ward Place, Colombo 07, Sri Lanka.

31.07.2024

Vice-Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

**Review of Recruitment Process in Public Service**

Your kind attention is invited to the letter no. PMO/SEC/09/02 dated 22.04.2024 sent by the Secretary to the Prime Minister regarding the Review of Recruitment Process in the Public Service (A copy is attached as **Annex I**).

It has been informed that requests for filling of essential vacancies should be submitted with proper justifications and recommendations to the Cabinet appointed Committee to review the recruitment process in public service.

As mentioned in the above letter, each institution should evaluate their existing staff in order to prepare a new staff plan with the optimal number of staff before submitting new cadre requests.

Therefore, please follow the instructions given in the above-said letter and complete the format given therein before submitting cadre requests for filling of vacancies at your University/Campus/Institute.

Furthermore, you are informed to send the above requests subject to the provisions stipulated in Circular No. 05 of 26.07.2024 on "Presidential Election – 2024" issued by the Election Commission of Sri Lanka.

**Senior Prof. Sampath Amaratunge**
Chairman

දුරකථනය / தொலைபேசி / Telephone } 2695301 2695302 2692357
ෆැක්ස් / பெக்ஸ் / Fax } 2688045
වෙබ් අඩවිය / வெப் தளம் / Website } http://www.ugc.ac.lk

Annex I

අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

| මගේ යොමුව<br>எனது குறியீடு<br>My Ref. | PMO/SEC/09/02 | ඔබේ යොමුව<br>உமது குறியீடு<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2024.04.22 |
|---|---|---|---|---|---|

**ඉතා වැදගත්**


සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රධානීන්

## රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම

උක්ත කරුණ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය ආශ්‍රිත එළැඹි අංක අමප/24/0420/601/029 හා 2024.03.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා සබැඳේ. (ඇමුණුම)


පසුගිය දශක දෙකක කාල පරාසය තුලදී විටින් විට බලයට පත්වූ රජයයන් විසින් එළැඹ ඇති ප්‍රතිපත්තිමය තීරණ මත, අනුමත කාර්ය මණ්ඩලවලට පරිභාහිරව හා නිසි මානව සම්පත් අධ්‍යයනයකින් තොරව කරනු ලැබ ඇති අවිධිමත් බඳවා ගැනීම් මත අසාමාන්‍ය ලෙස ප්‍රසාරණයකට ලක්ව ඇති වර්තමාන අනුමත රාජ්‍ය කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව, ජාත්‍යන්තරව භාවිතා වන සම්මත ආයතනික මානව සම්පත් කළමනාකරණ පිරමීඩය හා සැසඳීමේ දී ඉස්මතු වන ප්‍රායෝගික යථාර්ථය අකමැත්තෙන් වුවද පහත පරිදි දැක්විය හැක.

Hierachy of Optimum Management Levels




සම්මත ආයතනික මානව සම්පත් කළමනාකරණ පිරමීඩය

(රූප සටහන් අංක 01)




ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය සේවා මානව සම්පත් පිරමීඩයේ හැඩතල

(රූප සටහන් අංක 02)

ඒ අනුව, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සම්බන්ධව ඉදිරි පොදු ප්‍රතිපත්තිමය තීරණවලට එළැඹීමේදී, එක් එක් රාජ්‍ය ආයතනවල දැනටමත් සේවයේ නියුතු තථ්‍ය සේවක සංඛ්‍යාව හා ආයතන වෙත පැවරී ඇති රාජකාරිමය වගකීම් සහ කාර්ය මණ්ඩල රැකියා පිරිවිතර හා විස්තර යනාදිය ආශ්‍රිතව යළි පූර්ණ සමාලෝචනයට ලක්කිරීමේ අවශ්‍යතාව දැඩිව ඉස්මතුවී ඇත.

කාර්යාලය / அலுவலகம் / Gen. Office: 2575317, 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2574143, 2575454, 2575310
විද්‍යුත් තැපෑල / ஈ மெயில் / E - mail: secpm@pmoffice.gov.lk

රාජ්‍ය සේවයේ අනුමත කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාවේ අවිධිමත් අයුරින් සිදුව ඇති අති විශාල ප්‍රසාරණය මත, සක්‍රිය සේවයේ නිරත මෙන්ම විශ්‍රාමික ප්‍රජාව වෙත වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයට සිදුව ඇති දරාගත නොහැකි පීඩනය මත, රටේ වෙනත් කිසිදු ආර්ථික හා සමාජීය සංවර්ධන කාර්යයන් සඳහා කල හැකි ආයෝජන ඉඩ ප්‍රස්ථා අවහිරවීම, මෙන්ම රාජ්‍ය සේවකයින් හට ජීවත්වීමට සරිලන සාධාරණ වැටුපක් ගෙවීමට නොහැකිවීම, පුනරාවර්තන වියදම් ඉහල යාම හේතුවෙන් රාජ්‍යයේ ආයෝජන හැකියාව සංකෝචනය වීම නිසා පොදු සේවාවන් කඩා වැටීම මත සමස්ත සමාජයම දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් සිටීම යනාදී අර්බුදවලට මුහුණදීම පිණිස, තවදුරටත් ප්‍රමාද නොවී නිවැරදි මානව සම්පත් කළමනාකරණ ප්‍රවේශයකට එළැඹීමට අප ආයතන ප්‍රධානීන් ලෙස වගකීමෙන් බැඳී සිටිමු.

ඒ අනුව, ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව/ ආයතනය සඳහා දැනට අනුමත වී ඇති කාර්යමණ්ඩල සේවක සංඛ්‍යාව, පිළිවෙළින් ප්‍රතිශත ලෙස ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතියක හා ප්‍රාථමික යන සේවක කාණ්ඩවලට පෙළගස්වමින් (රූප සටහන් අංක 02 ට අනුගතව) මානව සම්පත් පිරමීඩයකට ගොනු කිරීමට පියවර ගත යුතුව ඇත. ඒ අනුව, නිර්මාණය වන ඔබ ආයතනික මානව සම්පත් පිරමීඩය, සම්මත මානව සම්පත් පිරමීඩයක (රූප සටහන් අංක 01 ට අනුගතව) ස්වරූපයට 2030 වර්ෂය වන විට හෝ පරිවර්තනය කරගැනීමේ ඉලක්ක පෙරදැරිව, ඔබ ආයතනය සඳහා වන සංශෝධිත කාර්ය මණ්ඩල සීමාවන් සකස් කරමින්, නව මානව සම්පත් පිරමීඩයක් ප්‍රක්ෂේපණය කර, ඒ සඳහා අවශ්‍ය ප්‍රශස්ත සේවක සංඛ්‍යාවන් ද ගණනය කරමින්, එම නව කාර්ය මණ්ඩල සැලසුමෙහි එක් එක් කාණ්ඩවල යම් හෙයකින් හෝ තවදුරටත් පුරප්පාඩු විද්‍යමාන වන්නේනම් පමණක්, ඒ සඳහා අනුමැතිය ලබාදීම පිණිස මෙම කමිටුව වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි.

ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/පළාත් සභාව/ ආයතනය විසින් එලෙස නව මානව සම්පත් ආයතනික ව්‍යුහයක් ප්‍රතිනිර්මාණය කිරීමේ දී, තොරතුරු තාක්ෂණ කේන්ද්‍රීය නව ඉ-රාජ්‍ය මහජන සේවා ප්‍රවේශ හරහා අවශ්‍ය වන ප්‍රශස්ත එහෙත් සීමිත නව කාර්ය මණ්ඩල, දැනටමත් අනුමත කාර්ය මණ්ඩල සීමාව ඇතුලත එහෙත් පසුගිය වසර 03කට වඩා වැඩි කාලයක් අඛණ්ඩව පුරප්පාඩුව පැවැති තනතුරු අහෝසි වූවා සේ සැලකීම, විශ්‍රාම් යාම් නිසා කාර්ය මණ්ඩල ප්‍රශස්තකරණයට ලක්කල හැකි තනතුරු සංඛ්‍යාව, යනාදී තාර්කික හා පිළිගත හැකි නිර්ණායකයන් භාවිත කරමින් නිසි මානව සම්පත් ගැළපීමක් ආයතනයේ ප්‍රධානියා ලෙස ඔබ හා මානව සම්පත් විෂය භාර අතිරේක ලේකම්/නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/අධ්‍යක්ෂ වෙතින් මෙම කමිටුව අපේක්ෂා කර සිටී.

වසර 2030 වන විට සමස්ත රාජ්‍ය සේවක සංඛ්‍යාව ආර්ථිකයට දැරිය හැකි මට්ටමකට පරිවර්තනය කිරීම මඟින් රාජ්‍ය සේවයේ නියුතු කාර්ය මණ්ඩල වෙත ආකර්ශණීය වැටුප් හා දීමනා ගෙවීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ගලපා ගැනීමටද හැකියාව සැලසෙනු ඇත.

එබැවින්, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති මෙම කමිටුව වෙත නව බඳවා ගැනීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට ප්‍රථමව, ඉහත නිර්දේශිත පරිදි කාර්ය මණ්ඩල අධ්‍යනයක් සිදුකිරීම අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවක් බව කාරුණිකව දන්වනු රිසියෙමි.

අනුර දිසානායක
අග්‍රාමාත්‍ය ලේකම්
සභාපති, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරි කමිටුව

දුරකථන අංකය : +94 11- 2575311 ෆැක්ස් අංකය : +94 11- 2575310
විද්‍යුත් ලිපිනය : secpm@pmoffice.gov.lk

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
3. විගණකාධිපති
4. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
6. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්
7. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
8. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව

} කරු.දැ.ගැ.ස.සහ අ.ක.ස.

රහසිගතයි

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# அமைச்சரவை அலுவலகம்
# OFFICE OF THE CABINET OF MINISTERS

**CABINET DECISION** **අමාත්‍ය මණ්ඩල තීරණය** **அமைச்சரவைத் தீர்மானம்**

මගේ අංකය: අමප/24/0420/601/029 2024 මාර්තු මස 12 දින.

**පිටපත්:**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.
විගණකාධිපති.

**ක්‍රියා කළ යුතු:**

ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්.
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්.
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.
අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව.

**රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය**
**<u>සමාලෝචනය කිරීම</u>**

(ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2024-02-28 දිනැති සංදේශය)

2024 මාර්තු මස 04 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

**එම්.ජී. තනුජා පණ්ඩිතරත්න**
අමාත්‍ය මණ්ඩලයේ ලේකම් (රා.ආ.)

21. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/0420/601/029 වූ, **"රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම"** යන මැයෙන් ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2024-02-28 දිනැති සංදේශය - (අමප අංක 22/1353/605/011 සහ අමප අංක 23/1172/605/012-V පිළිබඳව වූ පිළිවෙලින් 2022-09-12 හා 2023-07-04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අදාළව) ඉහත සඳහන් සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි තීරණය කරන ලදී:

→2

(i) සංදේශයේ 3 ඡේදයේ 3.1 අනුඡේදයෙහි යෝජිත පරිදි කටයුතු කිරීම පිණිස පහත සංයුතියෙන් යුත් නිලධාරි කමිටුව පත් කිරීම:

* අනුර දිසානායක මහතා,
අග්‍රාමාත්‍ය ලේකම් - (සභාපති);

* ඩබ්ලිව්.පී.පී.යසරත්න මහතා,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්;

* චාන්දනී විජේවර්ධන මහත්මිය,
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්;

* එස්.ආලෝකබණ්ඩාර මහතා,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්;

* හිරන්සා කළුතන්ත්‍රි මහත්මිය,
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්;

(ii) අග්‍රාමාත්‍ය ලේකම් විසින් නම් කරනු ලබන අග්‍රාමාත්‍ය කාර්යාලයේ අතිරේක ලේකම්වරයෙකු ඉහත සඳහන් නිලධාරි කමිටුවේ ලේකම්/ කැඳවුම්කරු වශයෙන් කටයුතු කළ යුතුය;

(iii) ඉහත (i)හි සඳහන් නිලධාරි කමිටුවේ කාර්යයන් සඳහා අවශ්‍ය යැයි සැලකෙන පරිදි අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ, අනෙකුත් අදාළ ආයතන ප්‍රධානීන්ගේ සහ අදාළ විෂයය පිළිබඳ ප්‍රවීණතාවක් සහිත අන් කවර හෝ නිලධාරියකුගේ / විද්වතකුගේ සහාය ද ලබා ගත හැකිය; සහ

(iv) ඉහත නිලධාරි කමිටුව විසින් එළඹෙනු ලබන තීරණ අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා ගැනීම පිණිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත අවස්ථාවෝචිත පරිදි ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අග්‍රාමාත්‍ය ලේකම්ට දැනුම් දීම.

→ 3

තවද, මෙම තීරණය සම්මත කරනු ලැබූ සේ සැලකීමටත්, ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත මෙම තීරණය දන්වා යැවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට බලය පැවරීමටත් තීරණය කරන ලදී.

ක්‍රියා කළ යුතු: **ජනාධිපති ලේකම්**

**අග්‍රාමාත්‍ය ලේකම්** - ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

**අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

පිටපත: **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්** - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

21. Cabinet Paper No.24/0420/601/029, a Memorandum dated 2024-02-28 by the President on "**Reviewing the Recruitment Process in the Public Service**" - (Cabinet decisions dated 2022-09-12 and 2023-07-04 on CP No.22/1353/605/011 and CP No.23/1172/605/012-V respectively refers) the above Memorandum was considered by the Cabinet. After discussion, it was decided:

    (i) to appoint the Officials' Committee with the following composition to pursue action as proposed in sub-paragraph 3.1 in paragraph 3 of the Memorandum:

    * Mr. Anura Dissanayake,
      Secretary to the Prime Minister - (Chairman);
    * Mr. W.P.P. Yasaratne
      Secretary, Ministry of Public Administration, Home Affairs, Provincial Councils & Local Government;
    * Mrs. Chandani Wijewardhana,
      Senior Additional Secretary to the President;
    * Mr. S. Alokabandara,
      Director General of Combined Services;
    * Mrs. Hiransa Kaluthantri,
      Director General,
      Department of Management Services;

    (ii) for an Additional Secretary of the Prime Minister's Office nominated by Secretary to the Prime Minister, to function as the Secretary/Convenor to the above Officials' Committee;

    (iii) the Officials' Committee referred to at (i) above could co-opt the assistance of Secretaries to Ministries, Heads of Departments, other relevant Heads of Institutions and any official/expert in the relevant subject deemed necessary for its deliberations; and

**Contd./02-**

(iv) to inform the Secretary to the Prime Minister to take necessary action to submit the decisions taken by the above Officials' Committee, to the Cabinet through the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government, as found necessary, to obtain the concurrence of the Cabinet.

It was also decided to treat this decision as confirmed and to authorize the Secretary to the Cabinet of Ministers to convey the same to the relevant authorities for necessary action accordingly.

Action by: **Secretary to the President**
**Secretary to the Prime Minister** - to be brought to the notice of the Hon. Prime Minister - copy of Memorandum annexed.
**My/Finance, Economic Stabilization and National Policies** - copy of Memorandum annexed.
**My/Public Administration, Home Affairs, Provincial Councils and Local Government** - copy of Memorandum annexed.
**Director General of Combined Services** - copy of Memorandum annexed.
**Director General, Department of Management Services** - copy of Memorandum annexed.

Copied to: **Secretary, Public Service Commission** - copy of Memorandum annexed.

Checked by : 1...
2...

## රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම

1. අමාත්‍යාංශය :

2. දෙපාර්තමේන්තුව / ආයතනය/ පළාත් සභාව :

3. අනුමත කාර්ය මණ්ඩලය :

4. තථ්‍ය කාර්ය මණ්ඩලය :

5. පුරප්පාඩු සංඛ්‍යාව :

6. පසුගිය වසර 03 තුල අඛණ්ඩව පැවති පුරප්පාඩු සංඛ්‍යාව

7. විශ්‍රාම යාම් නිසා කාර්ය මණ්ඩල ප්‍රශස්තකරණයට ලක්කල හැකි තනතුරු සංඛ්‍යාව

(3-7) තථ්‍ය කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්වීතියක හා ප්‍රාථමික යන සේවක කාණ්ඩවලට වෙන්කරමින් අදාළව නිවැරදි තොරතුරු ඇතුලත් ලේඛන ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කල යුතුය.

8. අනුමත කාර්ය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්වීතියක හා ප්‍රාථමික යන සේවක කාණ්ඩවල තනතුරු පුරප්පාඩු පැවතිය ද තොරතුරු තාක්ෂණ කේන්ද්‍රීය නව ඉ-රාජ්‍ය මහජන සේවා ප්‍රවේශ හරහා අවශ්‍ය වන ප්‍රශස්ත එහෙත් සීමිත නව කාර්ය මණ්ඩල හඳුනාගැනීමෙන් අනතුරුව 2030 වසරේදී ආයතනික ඉලක්ක සපුරා ගැනීමට යටත්ව අත්‍යාවශ්‍යයෙන්ම බඳවා ගත යුතු එක් එක් කාණ්ඩයන්හි පුරප්පාඩු ප්‍රමාණය හා තනතුරු නාමයන් (ඇමුණුමක් වශයෙන් භාවිතා කරන්න)

| කාණ්ඩය | අනුමත තනතුරු සංඛ්‍යාව (තනතුරු නාම සහිතව) | පුරප්පාඩු සංඛ්‍යාව (තනතුරු නාම සහිතව) | අනු අංක 8 හි දක්වා ඇති පරිදි අත්‍යාවශ්‍යයෙන්ම බඳවා ගත යුතු එක් එක් කාණ්ඩයන්හි පුරප්පාඩු ප්‍රමාණය හා තනතුරු නාමයන් |
|---|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨ | | | |
| 2. තෘතීයික | | | |
| 3. ද්වීතීයික | | | |
| 4. ප්‍රාථමික | | | |

*අදාළ තොරතුරු පාදක කරගනිමින් ඔබ ආයතනයේ වර්තමාන මානව සම්පත් පිරමීඩයක් සහ යෝජිත ප්‍රශස්ත මානව සම්පත් පිරමීඩයක් සන්සන්දනාත්මකව නිර්මාණය කර ඇමුණුමක් ලෙස ඉදිරිපත් කරන්න.

9. ඔබ ආයතනයෙහි දැනටමත් සේවයේ නියුතු තථ්‍ය සේවක සංඛ්‍යාව හා ආයතනය වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිතමය වගකීම් සහ කාර්ය මණ්ඩල රැකියා පිරිවිතර හා විස්තර සමග ගැලපීමෙන් පසුවද ඉහත දක්වා ඇති තාක්ෂණයට අනුගත වීමේ අනාගත පුරෝකථනද සමග විධිමත් මානව සම්පත් විශ්ලේෂණයකින් හඳුනා ගත් ඉහත එක් එක් කාණ්ඩ සඳහා වන පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කල පසුව ආයතනික ඉලක්කයන් සපුරා ගත හැකිද යන්න පිළිබඳ ඔබ නිරීක්ෂණ

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

10. ආයතනයේ කටයුතු ප්‍රශස්තව පවත්වා ගෙන යාමට බාධාවක් වන අයුරින් හඳුනාගත් පුරප්පාඩු තනතුරුවල ඇති වී ඇති දැඩි අවශ්‍යතාවය සංක්ෂිප්තව

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

11. මෙම තනතුරු ඇති කිරීම/ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් අතිරේක ලේකම් (මානව සම්පත්)/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ අධ්‍යක්ෂගේ නිර්දේශය

.....................................................................................................................................................

.....................................................................................................................................................

............................................... ................................

අත්සන හා නිලමුද්‍රාව දිනය

12. මෙම තනතුරු ඇති කිරීම/ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ සාධාරණීකරණය සහ පෞද්ගලිකවම සෑහෙන බවට නිර්දේශය

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

............................................... ................................

අත්සන හා නිලමුද්‍රාව දිනය